# 15 සිත් පුරවමු අපි සත්ත්ව දයාවෙන්

අමිල ඉරු දින අලුයම අවදි වී ප්‍රසන්න මුහුණින් යුතු ව දහම් පාසලට පිය නගන ශිෂ්‍යයෙකි. වෙන ද ඉතා ප්‍රබෝධවත් ව සිටින ඔහු එදින යම් කනස්සල්ලකින් සිටිනු දුටු පොඩි හාමුදුරුවෝ ඒ පිළිබඳ ඔහුගෙන් විමසූහ.

"මොක ද අමිල අද කනස්සල්ලෙන් වගේ?" අමිල තමන් අත තිබුණු බුදුසරණ පුවත් පත දිගු කරමින් එහි තිබුණු සේයාරුවක් වෙත පොඩි හාමුදුරුවන්ගේ අවධානය යොමු කරවී ය.

පුවත්පත පිරික්සා බැලූ පොඩි හාමුදුරුවන්ට දක්නට ලැබුණේ ස්වාමීන් වහන්සේ නමකගේ දෙපා මුල වැඳ වැටී සිටින වසු පැටවෙකි. ස්වාමීන් වහන්සේ වසු පැටවා දෙස කරුණාවෙන් බලා සිටින ආකාරය එහි දිස් විය. අවට තව එළදෙනුන් කිහිප දෙනෙකි. ඒ සියලු ම හරකුන් ගෙනැවිත් තිබුණේ මස් පිණිස මැරීමට ය.

ඒ වන විට අමිලගේ යහළුවෝ ද එතැනට වට වී පුවත්පතෙහි පළ වූ ඡායාරූපය බලා විස්තරය කියවන්නට වූහ. ඔවුන්ගේ මුහුණු ද දුකින් බරවන අයුරු දක්නට ලැබිණි.



"අනේ හාමුදුරුවනේ, මා බේරාගත්තාට බොහොම පින්"

අමිලගේ සිතේ කනස්සලු ස්වභාවය හඳුනා ගත් පොඩි හාමුදුරුවෝ,

"අපි මේ පින්තූරය ලොකු හාමුදුරුවන්ට පෙන්වමු" යි පවසා එම පුවත විහාරස්ථානයේ නායක ස්වාමීන් වහන්සේට සැළ කර සිටියහ.

පුවත්පතේ සේයා රුව පිරික්සූ ලොකු හාමුදුරුවෝ, "බෞද්ධ දරුවන් බුදුසරණ පුවත්පත සතිපතා කියවීම හොඳ පුරුද්දක්. අමිල දරුවා මා අගය කරනවා. මේ පුවත් පතේ සඳහන් සිදුවීම මට ද දැන ගන්නට ලැබුණා. සතුන් මැරීම, සතුන්ට වද දීම, සාපරාධී, පාපකාරී ක්‍රියාවක්. ඒ සතුන්ගේ නිදහසේ ජීවත් වීමේ අයිතිය පැහැර ගැනීමක්. මේ පින්තූරයේ වැඩ සිටින ස්වාමීන් වහන්සේ ඔය වසු පැටවා මරණයෙන් නිදහස් කරගෙන තිබෙනවා. ඒක ඉතා වටිනා පින්කමක්.

"දරුවනේ, ජීවිතයක වටිනාකම අප්‍රමාණයි. අපට අපේ ජීවිතය කොයිතරම් වටිනව ද හැම දේකට ම වඩා.? ඒ වගේ ම තමයි ඕනෑම සතකුට ඒ සතාගේ ජීවිතය වටිනවා. අපි අපේ ජීවිතයට ආදරය කරන්නා වගේ හැම සතෙක් ම තම ජීවිතයට ආදරය කරනවා. අපා, දෙපා, සිවුපා, බහුපා සියලු ම සත්තු ජීවත් වීමේ අයිතිය ඇති අය. බුදු දහම උගන්වනව ඒ කිසි ම වර්ගයකට අයත් ප්‍රාණියකුට හිංසා නොකළ යුතු බව. දයාව කරුණාව හිතවත්බව උපදවා ගත යුතු බව. ඒකයි මනුස්සකම. ඒකයි දරුවනේ බෞද්ධකම. බලන්න මේ සතා උගේ ජීවිතයට ඇති ආදරය. ඌ කියන්නෙ ඌට අභය දනය ලබා දුන්නාට පින් සිදු වේවා කියලයි.

"වසු පැටවා මරන්න උත්සාහ කළ අයට පව් සිදුවෙනවා නේ ද හාමුදුරුවනේ"? මධුර ඇසුවේ ය.

"ඔව්. ඔව් දරුවනේ, සතකු නොමැරුවත්, මරන චේතනාවෙන් පවා පව් සිදු වෙනවා. බුදුරජාණන් වහන්සේ සත්ත්ව හිංසනය පිටු දකිමින් බොහෝ ධර්ම දේශනා කර තිබෙනවා" යි නායක ස්වාමීන් වහන්සේ පැවසූහ.

එවිට ම සණ්ඨාව නාද විය. ඒ උදෑසන බුද්ධ පූජාව සඳහා දරුවන් රැස් කරන නාදයයි. සුදුවතින් සැරසුණු දහම් පාසල් දරු දැරියෝ බුදු මැදුර අබියස පෙළ ගැසුණහ. බුද්ධ පූජාව පැවැත්වූ ලොකු හාමුදුරුවන් පූජාව අවසානයේ දී තම අනුශාසනාව යොද ගත්තේ සත්ත්ව හිතවාදී බෞද්ධ ආකල්පය පිළිබඳ ව දරුවන් දැනුවත් කිරීමටයි.

නායක ස්වාමීන් වහන්සේ උදෑසන අමිල විසින් ගෙන හැර දක්වන ලද සිද්ධිය පිළිබඳ දරු පිරිස දැනුවත් කර අමිලගේ එම සානුකම්පික හැඟීම අගය කළ සේක. සියලු

ජීවීන්ට හිතවාදී ව කටයුතු කිරීමේ වැදගත්කම අවධාරණය කළ උන් වහන්සේ, මෙසේ ද පැවසූහ.

"දරුවනේ, සෑම ප්‍රාණියකුගේ ම ජීවිතය වටිනවා. මේ බව තේරුම් ගත හැකි උසස් මනසක් ඇත්තේ මිනිසාටයි. ලොව්තුරා සම්මා සම්බුද්ධත්වය දක්වා දියුණු කළ හැකි මනසක් ඇති එක ම සත්ත්වයා මිනිසායි. මිනිසා ඇතුළු සියලු ම සත්ත්වයන්ගේ ජීවත් වීමේ අයිතිය ආරක්ෂා කිරීමට අප තදින් ම බැඳී සිටිනවා. මැරීම, මැරවීම හෝ ඒ සඳහා අනුබල දීම හෝ අප නොකළ යුතුයි. අප කළ යුතු වන්නේ මරන්නට නියමවී සිටින සත්ත්වයන් මරණයෙන් මුදා ගැනීමයි; ජීවත් වීමේ අයිතිය ලබා දීමයි. එය අභය දානය ලෙස බුදුරජාණන් වහන්සේ පැහැදිලි කර තිබෙනවා. ඒ වගේම හිංසාවෙන් ද වැළකිය යුතුයි; සියලු සත්ත්වයන්ට මෙත් වැඩිය යුතුයි.

අප සත්ත්ව හිංසාවෙන් හා ඝාතනයෙන් වැළකීමෙන් සිත් තුළ ඇති වන කරුණා මෛත්‍රී ගුණ නිසා බොහෝ දෙනාට ප්‍රිය වෙනවා. මෙලොව වශයෙන් අන් අයගෙන් වන දුක් ගැහැටෙන් අත් මිදෙනවා. සමහරු ධනෝපායන ක්‍රම ලෙස සත්ත්ව වෙළෙඳාමෙහි, මාංස වෙළෙඳාමෙහි යෙදෙනවා. ඒ තුළින් සිදුවන්නේ ද සත්ත්ව හිංසාවමයි. බුදුරජාණන් වහන්සේ එවන් අධාර්මික ධනෝපායන ක්‍රම ප්‍රතික්ෂේප කර තිබෙනවා.

විනෝදාංශයක් ලෙස වුව ද පීඩා ඇතිවන සේ තිරිසන් සතුන් ඇති කිරීමත් වැරදි ක්‍රියාවක්. කුරුල්ලන් වැනි සතුන් කූඩු කරගෙන සිටින දරුවන් මා දැක තිබෙනවා. ඉන් සිදු වන්නේ සතුන්ට නිදහසේ ජීවත් වීමේ අයිතිය අහිමි කිරීමයි.

තිරිසන් සතුන් ආදරයෙන් රැකබලා ගැනීමත්, ගොවිතැන් කටයුතු ආදිය සඳහා යොදා ගැනීමත්, සත්ත්ව හිංසාවක් වන්නේ නැහැ. එහි දී සතුන්ට අවශ්‍ය ආහාර පානාදිය ලබා දීම, සතුන් නැවීම, රෝගී වූ විට ප්‍රතිකාර ලබා දීම, සතුන් ආරක්ෂා කර ගැනීම ආදිය සිදු කරන්නේ සතුන් කෙරෙහි අසීමිත දයාවෙන්, කරුණාවෙන්. අපේ මුතුන් මිත්තන් ගොවිතැනට යොදගත් හරකාට පවා කතා කෙළේ '**තෙරුවන් සරණයි! බුදුන් දැකපන් මගෙ සුරතල් මීමෝ**' කියල දයාබර වචනවලිනි.

පංච ශීලයෙහිත්, අෂ්ඨාංග ශීලයෙහිත්, දස ශීලයෙහිත් පළමු වන සිල් පදය වන්නේ ප්‍රාණ ඝාතයෙන් වැළකීමයි. එසේ ම දස කුසල්වල දැක්වෙන පළමු වන කුසල කර්මය වන්නේ ද ප්‍රාණඝාතයෙන් වැළකීමයි"

තව දුරටත් මේ පිළිබඳ ව කරුණු දැක්වූ නායක හාමුදුරුවෝ බුදුරජාණන් වහන්සේ සත්ත්ව හිංසනය වැළැක්වීම සඳහා ඉදිරිපත් වූ අවස්ථාවක් උදාහරණ වශයෙන් ගෙන හැර දැක්වූහ.

"දරුවනේ, අප සම්මා සම්බුදුරජාණන් වහන්සේ දෙව්රම් වෙහෙරින් බැහැර ව පිඬු පිණිස වැඩම කරන අවස්ථාවක මහ මග ළමයි පිරිසක් නො සන්සුන් ව හැසිරෙනු දුටුවා. ඔවුන් අතර සමහරු ගල් මුල්වලින් සර්පයකුට පහර දෙමින් සිටියා. බුදුරජාණන් වහන්සේ ළමයින් වෙතට වැඩම කොට එසේ සර්පයාට පහර දීමට හේතු විමසුවා. එවිට ළමයි, සර්පයා තමන්ට දෂ්ඨ කරති යි බියෙන් පහර දෙන බව පැවසුවා.

එම අවස්ථාවේ බුදුරජාණන් වහන්සේ, අප වේදනා විඳින්නට අකැමැති වන්නාක් මෙන් අනෙක් අය ද දුක් පීඩා විඳින්නට අකැමැති බව පැහැදිලි කරමින් ධර්ම දේශනා කළා. එම ගාථා ධම්ම පදයේ දණ්ඩ වග්ගයේ සඳහන් වෙනවා.

**සුඛකාමානි භූතානි යො දණ්ඩේන විහිංසති,**
**අත්තනෝ සුඛමේසානෝ පෙච්ච සෝ න ලභතේ සුඛං.**

යමෙක් තමාගේ සැප බලාපොරොත්තුවෙන් තමා සේ ම සැප කැමැති කවර ජීවියකු වුවද දණ්ඩෙන් පෙළයි ද පහරදෙයි ද හෙතෙම පරලොව දී සැප නො ලබයි.

**සුඛකාමානි භූතානි යො දණ්ඩේන න හිංසති,**
**අත්තනෝ සුඛමේසානෝ පෙච්ච සෝ ලභතේ සුඛං.**

යමෙක් තමාගේ සැප බලාපොරොත්තුවෙන් තමා සේ ම සැප කැමැති කවර හෝ ජීවියකු දණ්ඩෙන් නොපෙළයි ද, හෙතෙම පරලොව දී සැප ලබයි.

බුදුරජාණන් වහන්සේ මෙහි දී දක්වා ඇත්තේ හිංසනය මෙලොව පරලොව දෙකෙහි දී ම දුක් සහිත විපාක ගෙන දෙන බව සහ හිංසනයෙන් තොර වීම, සියල්ලන්ට ම කරුණාව දයාව දැක්වීම, මෙලොව, පරලොව දෙකෙහි දීම සැප විපාක පිණිස හේතුවන බව" යැයි නායක හාමුදුරුවෝ පැවසූහ. බොදු දරුවන් වශයෙන් හිංසනයෙන් තොර වී මිනිසුන් ඇතුළු සමස්ත ජීවලෝකයට ම ආදරය කරුණාව දැක්වීම වැදගත් බවත් උන්වහන්සේ පැවසූහ.

දහම් පාසල් දරු දැරියන් වශයෙන් ඔබට ද මේ සඳහා විවිධ වැඩ සටහන් ක්‍රියාත්මක කළ හැකියි. එසේ දයක විය හැකි අවස්ථා මොනවා දැයි නායක ස්වාමීන් වහන්සේ දරු දැරියන්ගෙන් විමසූහ.

"හාමුදුරුවනේ, සතුන්ට නිදහසේ ආහාර ගැනීමට තැනක් ගෙවත්තේ සාදා දිය හැකියි." තුෂාර පැවසී ය.

"සතුන්ට නාන්න ජල බඳුනක් සැපයිය හැකියි" තමරා පැවසුවා ය.

"හාමුදුරුවනේ, මරන්න නියම වුණු සතුන් නිදහස් කර ගන්න පිං කැටයක් පවත්වා ගෙන යන්න පුළුවන්" අමිල පැවසුවේ ය.

"ඉතාමත් හොඳයි දරුවනේ, ඔබගේ අදහස් ඉතාම වටිනවා. ඒ සියල්ල ඔබට ක්‍රියාවට නංවන්න පුළුවන් ඒවා. අපගේ සිත් තුළ නිතර මෛත්‍රිය වැඩීම හිංසනයෙන් වැළකීමට හේතු වෙනවා.

"**සබ්බෙ සත්තා භවන්තු සුඛිතත්තා**" "සියලු සත්ත්වයෝ සැපවත් වූ ජීවිත ඇත්තෝ වෙත්වා"යි මෙත් වැඩීමට බුදුරදුන් අපට කළ අවවාදය තුළින් බුදු දහමේ එන සර්ව සත්ත්ව හිතවාදී ආකල්පය තව දුරටත් තේරුම් ගන්න පුළුවන්.

බෞද්ධ දරුවන් හැටියට හිංසනය සඳහා වන පොලු, මුගුරු, කැට කැබලිති, අවි ආයුධ අතහැර නිරායුධ වී, බිය කිරීම්, හිංසා, ඝාතන ආදියෙන් වැළකී මුළු මහත් ලෝකයට ම හිතවත් ව මම ක්‍රියා කරන්නෙමි"යි අධිෂ්ඨාන කරගත යුතු බව පවසා නායක මාහිමිපාණන් වහන්සේ අනුශාසනාව අවසන් කළහ.

"හිංසනයෙන් වැළකී සැමවිට සැමට ම හිතවාදී වෙමු" යන මාතෘකාව යටතේ නාට්‍යයක් රඟ දැක්වීමට අමිල කළ යෝජනාව නා හිමිගේ ප්‍රශංසාවට ලක්වූ අතර මීට අදළ ව චිත්‍ර ප්‍රදර්ශනයක් කිරීමට ප්‍රේමා ගුරුතුමී ඉදිරිපත් කළ අදහසට සියලු දෙනා කැමැත්ත පළ කළහ.

### සාරාංශය

බුදු දහමෙහි දක්වෙන ජීව හිතවාදී ආකල්පය ඉතා පළල් එකකි. සීල ප්‍රතිපදාවේ දී ප්‍රාණ ඝාතයෙන් වැළකී සියලු සත්ත්වයන්ගේ ජීවිත ආරක්ෂා කිරීමට ඇති කරගනු ලබන ශික්ෂණයෙන් එය ඇරඹේ. අපා, දෙපා, සිවුපා, බහුපා යනුවෙන් සත්ත්වයන් වර්ග කිරීමේ දී ඊට අයත් නො වන කිසිදු සත්ත්වයෙක් ලොව නොමැත. ඒ සැමට මෛත්‍රිය වැඩිය යුතු බව ද, එසේ කිරීමෙන් තමාට මෙලොව ආරක්ෂාව සැලසෙන බව ද බුදුරජාණන් වහන්සේ වදාළහ. **සබ්බේ සත්තා භවන්තු සුඛිතත්තා** යනුවෙන් කළ දේශනාව ද සර්ව සත්ත්ව හිතවාදී බෞද්ධ දැක්ම මැනවින් ප්‍රකට කරයි. සියලු සතුන් කෙරෙහි පතළ මහා කරුණාව බුද්ධත්වයෙහි ප්‍රමුඛ ලක්ෂණයක් වන අතර එය චරිතායනය කරමින් සර්ව සත්ත්ව හිතවාදී ජීවිතයක් ගොඩනගා ගැනීමට අප කුඩා කල සිට ම උත්සාහ දැරිය යුතු ය.

## ක්‍රියාකාරකම්

01. සියලු සතුනට ලොව ජීවත් වීමේ අයිතිය ඇති බව පිළිගැනෙන බෞද්ධ ඉගැන්වීම් දෙකක් නම් කරන්න.

02. සත්ත්වයන්ට ජීවත් වීමේ අයිතිය අහිමි කරවන, අවස්ථා කිහිපයක් දක්වන්න.

## පැවරුම

01. කරුණාව යන්නෙහි බෞද්ධ අර්ථය සොයන්න.

02. සත්ත්ව හිතවාදී ආකල්ප වර්ධනය කර ගැනීම සඳහා තමාටත්, සමාජයටත් නිතර දකබලා ගැනීමට සුදුසු ආදර්ශ පාඨ දහයක් සකසන්න.

## පුහුණුවට

අපාදකේහි මේ මෙත්තං මෙත්තං දිපාදකේහි මේ
චතුප්පදේහි මේ මෙත්තං මෙත්තං බහුප්පදේහි මේ
බන්ධ පරිත්ත